සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ක්‍රිස්තියානි ධර්මය	I
கிறிஸ்தவம்	I
Christianity	I

43 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

1. පුරාණ ගිවිසුම හෙබ්‍රෙව් හා ඇරමයික් භාෂාවලින් ලියා තිබීමට හේතුව කුමක් ද?
   (1) බබිලෝනියානු විප්‍රවාසයෙන් පසුව අනෙක් භාෂා තහනම් වීම
   (2) ක්‍රි. පූ. 63 දී පලස්තීනය රෝම ප්‍රාන්තයක් බවට පත් වුව ද ග්‍රීක භාෂාව භාවිත කිරීම
   (3) බබිලෝනියානු විප්‍රවාස සමයෙහි යුදා ජනතාව ඇරමයික් භාෂාවට හුරු වීම
   (4) ලේඛන කලාවට හා අධ්‍යයනයට පහසු වීම
   (5) ක්‍රි. පූ. 333 දී ග්‍රීක අධිරාජ්‍යයා වූ මහා ඇලෙක්සැන්ඩර් පලස්තීනය ආක්‍රමණය කිරීම

2. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ එස්ඩ්‍රාලොන් තැනිතලාව හා සම්බන්ධ වැදගත් සිදු වීමක් වන්නේ,
   (1) නායින් නුවර වැන්දඹුවගේ පුතා උත්ථාන කිරීමයි.
   (2) කානා නුවර දී වතුර වයින් කිරීමයි.
   (3) ලාදුරු රෝගීන් දස දෙනා සුව කිරීමයි.
   (4) ප්‍රථම ශ්‍රාවකයින් තෝරා ගැනීමයි.
   (5) අංශභාග රෝගියා සුව කිරීමයි.

3. තමන්ට පෙර සිටි රජවරුන්ට යුද්ධ කාර්යයෙහි නියැලීමට සිදු වූවත්, සාමකාමීව සිය රජ සමය ගත කළ රජතුමා වන්නේ,
   (1) සාවුල් ය. (2) සලමොන් ය. (3) දාවිත් ය. (4) ජොෂියා ය. (5) ශෙදකියා ය.

4. අන්‍ය ජාතික වන්දනාවට සම්බන්ධ වූ පූජාසනය ඇතුළු සියලු ම භාණ්ඩ දේව මාලිගාවෙන් ඉවත් කිරීම සිදු වූයේ,
   (1) පර්සියානු යුගයේ දී ය.
   (2) මහා හෙරෝද් රජ සමයේ දී ය.
   (3) රෝම යුගයේ දී ය.
   (4) දාවිත් රජ සමයේ දී ය.
   (5) ග්‍රීක යුගයේ දී ය.

5. ආරම්භයේ දී මනුෂ්‍යයා හා සත්ත්වයා මාංශවලින් තොරව ආහාර ගැනීම තුළින් පිළිබිඹු වන්නේ,
   (1) මැවිල්ලේ සාමකාමීත්වයයි. (2) දෙවියන් වහන්සේගේ කැමැත්තයි.
   (3) ආදි මව්පිය කැමැත්තයි. (4) මැවිල්ලේ ආධිපත්‍යයයි.
   (5) පූජක සම්ප්‍රදායයි.

6. විද්‍යාවේ පරමාර්ථය හා ධර්මයේ අරමුණ අතර වෙනසක් පවතී. 2 තිමොති 3:15 අනුව ධර්මයේ මූලික අරමුණ වන්නේ,
   (1) ලෝකය සංවර්ධනය කිරීමයි.
   (2) මිනිසාගේ ගැලවීමයි.
   (3) සහජීවනය ඇති කිරීමයි.
   (4) අසල්වැසි ප්‍රේමයයි.
   (5) දේව ධාර්මික සත්‍යතා පැහැදිලි කිරීමයි.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7. ප්‍රාග් ඉතිහාසය සම්පාදනය වීමෙහිලා දායක වී ඇති සම්ප්‍රදායන් **දෙක** වන්නේ,
(1) යාවේ සහ එලොහිම් ය. (2) ද්විතීය නීති සහ පූජක ය.
(3) යාවේ සහ ද්විතීය නීති ය. (4) යාවේ සහ පූජක ය.
(5) එලොහිම් සහ පූජක ය.

8. උත්පත්ති 2:19 අනුව ආදම් සියලු ම මෘගයින්ට නම් තැබීමෙන් අදහස් කරන්නේ, මිනිසාට ඔවුන් කෙරෙහි ඇති
(1) ආධිපත්‍යයයි. (2) දයානුකම්පාවයි. (3) අයිතියයි.
(4) ගෞරවයයි. (5) වගකීමයි.

9. යාවේ සම්ප්‍රදායට අනුව ජල ගැල්මට හේතුව අධික වර්ෂාව වුවත් පූජක සම්ප්‍රදායට අනුව ජල ගැල්මට හේතුව කුමක් ද?
(1) ලොව පුරා පැතිර ඇති මනුෂ්‍යයාගේ දුෂ්ටකම
(2) සාගරයේ ජල මට්ටම ඉහළ යාම
(3) පොළොවෙන් පැන නැගුන දිය උල්පත් නිසා ජල ගැල්ම ඇති වීම
(4) පාපයෙන් විනාශ වූ සකල මැවිල්ල විනාශ කිරීමට තීරණය කිරීම
(5) ස්වභාව ධර්මය විනාශ කිරීම හේතු කොට ගෙන උද්ගත වී ඇති පාරිසරික ගැටළු

10. දෙවියන් වහන්සේ විසින් තමන් වහන්සේගේ නිදහස් කැමැත්තෙන් තෝරා ගනු ලැබූ ගැලවීමේ ඉතිහාසය හා සම්බන්ධ පළමු පුද්ගලයා කවුරුන් ද?
(1) නෝවා (2) ආබ්‍රහම් (3) ඊසාක් (4) ජාකොබ් (5) මෝසෙස්

11. පහත සඳහන් වසංගත සලකන්න.
A - මැඩි උවදුර
B - කිනිතුලු උවදුර
C - ගව සම්පත් වැනසීම
D - ගඩු උවදුර
E - ගල් වර්ෂාව
F - පළගැටි උවදුර
ඉහත ඒවා අතුරෙන්, මෝසෙස්තුමා පාරාවෝ රජු මුණගැසී අනතුරු අඟවමින් මතු සිදුවන්නට යන දේ පවසා එවන ලද වසංගත මොනවා ද?
(1) *A, B* හා *C* පමණි (2) *A, C* හා *F* පමණි (3) *B, D* හා *E* පමණි
(4) *C, D* හා *F* පමණි (5) *D, E* හා *F* පමණි

12. දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකඟතාවක් ගිවිසුමක් ලෙස හඳුන්වනු ලැබේ. ඒ සඳහා වන හිබ්‍රෙව් වචනය කුමක් ද?
(1) සෙගුල්ලහ් (2) ගෝයි කඩොෂ් (3) කොහෙන් (4) බරිත් (5) මතෙටෙස්

13. අසිරියානු අධිරාජ්‍යයාට විරුද්ධව සටන් කළ දමස්කයේ රජුගේ නම කුමක් ද?
(1) ආහස් (2) රේෂින් (3) පෙකා (4) සෙනාකෙරීබ් (5) සාවුල්

14. ජුදයාවේ රජවරුන් වන ජෝතාම්, ආහස් හා හෙසකියා යන තිදෙනාගේ රාජ්‍ය පාලන කාලයට සම්බන්ධ දිවැසිවරයා කවුරුන් ද?
(1) යෙසායා (2) ජෙරමියා (3) හොසියා (4) එසකියෙල් (5) ශෙදකියා

15. පරිපාලන ක්ෂේත්‍ර ඉලක්ක කර ප්‍රභූ පන්තියේ යෞවනයින් පුහුණු කිරීම සඳහා වූ ප්‍රඥාවේ ප්‍රභේදයක් වන්නේ,
(1) අභිධාර්මික ප්‍රඥාවයි.
(2) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාවයි.
(3) ප්‍රායෝගික ප්‍රඥාවයි.
(4) රාජ්‍ය සභා ප්‍රඥාවයි.
(5) පවුල හා ගෝත්‍රික ප්‍රඥාවයි.

16. දිව්‍ය පූජාවේ දී දේව වචනයට පිළිතුරක් ලෙස ගැයීමට යොදා ගනු ලබන ශුද්ධ බයිබලයේ ග්‍රන්ථය කුමක් ද?
(1) හිතෝපදේශය (2) ධර්මදේශකයා (3) ගීතාවලිය
(4) සලමොන්ගේ ප්‍රඥාව (5) ප්‍රේම ගීතය

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

17. ගලීලයාව හා පෙරයා ප්‍රදේශ භාරව ගලීලයේ ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළේ,
(1) පොන්තියුස් පිලාතේ ය. (2) ජූලියස් සීසර් ය.
(3) පිලිප් ද ටෙට්‍රාක් ය. (4) මහා හෙරෝද් ය.
(5) හෙරෝද් ඇන්ටිපස් ය.

18. ජුදා සමාජය තුළ කාන්තාවන්ගේ නිසි සමාජ අයිතිවාසිකම් ඉස්මතු කිරීමේ අවශ්‍යතාව පසුබිම් කොටගෙන "මරියා යහපත් දේ තෝරාගෙන ඇතැයි" ජේසුස් වහන්සේ පැවසුයේ,
(1) ඇයගේ ක්‍රියාව අගය කිරීමට ය.
(2) මාර්තාගේ ක්‍රියා අවතක්සේරු කිරීමට ය.
(3) ඇය ලාසරස්ගේ නැගණිය වූ නිසා ය.
(4) තම ශ්‍රාවකයින්ට ඇය සංග්‍රහ කළ නිසා ය.
(5) ඇයගේ සොහොයුරිය උන්වහන්සේට උපස්ථාන කළ නිසා ය.

19. පහත සඳහන් කරුණු සලකන්න.
A - ඉගැන්වීම
B - යාග පූජා ඔප්පු කිරීම
C - යාච්ඤා කිරීම
D - සුව කිරීම් සිදු කිරීම
E - භාවනා කිරීම
F - වත්පිළිවෙත් ඉටු කිරීම
ඉහත කරුණු අතුරෙන් ධර්මශාලා හෙවත් සිනගෝගය තුළ සිදු කළ කාර්යයන් වන්නේ,
(1) *A*, *B* හා *C* ය. (2) *A*, *B* හා *D* ය. (3) *A*, *C* හා *E* ය.
(4) *B*, *D* හා *F* ය. (5) *D*, *E* හා *F* ය.

20. මාංශවත් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජුදා ජනතාව අපේක්ෂාවෙන් සිටි මෙසියස් වහන්සේ බව අවධාරණය කරන්නේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ පාවුලුතුමා (2) ශුද්ධ වූ ලූක්තුමා
(3) ශුද්ධ වූ මාක්තුමා (4) ශුද්ධ වූ මතෙව්තුමා
(5) ශුද්ධ වූ ජොහන්තුමා

21. ශුද්ධ වූ පාවුලුතුමාගේ තුන්වන චාරිකාවේ දී සිදු වූ විශේෂ සිදුවීමක් වන්නේ,
(1) සිරගෙදර දී පාද සිරකර රැකවල් දැමීමයි.
(2) "අතින් සෑදූ දෙවිවරුන්, දෙවිවරුන් නොවෙතියි" පාවුලුතුමා දේශනා කිරීමයි.
(3) ශුද්ධ වූ පාවුලුතුමා දර්ශනයක් දැකීමයි.
(4) සිරගෙයි මුලාදැනියා ස්වාමීන් වහන්සේව අදහා ගැනීමයි.
(5) ජුදෙව් ධර්මශාලාවල ශුභාරංචිය දෙසීමට අවස්ථාව ලැබීමයි.

22. ශුද්ධ වූ පාවුලුතුමා ක්‍රිස්තුන් වහන්සේ විසින් ම යවන ලද අපෝස්තුලුවරයා බව තහවුරු කිරීම අරමුණු කරගත් හසුන කුමක් ද?
(1) එපීස (2) ගලාති (3) රෝම
(4) දෙවන කොරින්ති (5) පළමු තෙසලෝනික

23. ශුද්ධ වූ මතෙව්තුමා ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වා දෙන්නේ ලෝකයට දේව රාජ්‍යය ප්‍රකාශ කළ,
(1) සාමයේ කුමාරයාණන් ලෙසට ය. (2) ධර්මිෂ්ඨයාණන් ලෙසට ය.
(3) දිව්‍ය වෛද්‍යවරයාණන් ලෙසට ය. (4) සදාතන පියාණන් ලෙසට ය.
(5) ගුරු දේවයාණන් ලෙසට ය.

24. අවසානයේ දී දම්වුන් අදම්වුවන්ගෙන් වෙන් කර ඒ ඒ අයට සුදුසු විපාකය දෙන බව උගන්වන්නේ,
(1) වපුරන්නා පිළිබඳ උපමාවෙනි. (2) අබ ඇටය පිළිබඳ උපමාවෙනි.
(3) දැල පිළිබඳ උපමාවෙනි. (4) නිධානය පිළිබඳ උපමාවෙනි.
(5) මුතු ඇටය පිළිබඳ උපමාවෙනි.

25. යෙසායා දිවැසිවරයාට අනුව සියල්ලන් දණ නමනු ලබන උත්තරීතර නාමය වන්නේ,
(1) ගැලවුම් කරුවාණන් ය. (2) විමුක්තිදායකයාණන් ය.
(3) සුවදායකයාණන් ය. (4) වෛද්‍යවරයාණන් ය.
(5) ස්වාමීන් වහන්සේ ය.

[ඉතිරිය පිටුව බලන්න.
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

26. ප්‍රසාද ස්නාපනයේ දී 'ක්‍රිස්මා තෙලයෙන්' ආලේප කිරීම තුළ ලැබෙන වගකීම් වන්නේ,
(1) රාජකීය, දිවැසිවර සහ සේවකයි. (2) පූජක, දිවැසිවර සහ රාජකීයයි.
(3) පූජක, එඬේරික සහ රාජකීයයි. (4) පූජක, දිවැසිවර සහ සේවකයි.
(5) දිවැසිවර, එඬේරික සහ රාජකීයයි.

27. ක්‍රිස්තුන් වහන්සේ දේව වචනය මෙන් ම, දේව වචනය ප්‍රකාශ කරන්නා බව ද සඳහන් වන්නේ,
(1) සීනයි ගිවිසුමේ ය. (2) කල්වාරි ගිවිසුමේ ය.
(3) නෝවා සමග ගිවිසුමේ ය. (4) නව ගිවිසුමේ ය.
(5) පුරාණ ගිවිසුමේ ය.

28. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර 'ශාරීරික සූදානම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) ස්නානය කර පිරිසිදුව පැමිණීම
(2) යහපත් පාපොච්චාරණයක් කර සිටීම
(3) පැයක කාලයක්වත් සියලු ආහාරවලින් වැළකී සිටීම
(4) පිරිසිදු ඇඳුමෙන් සැරසී සිටීම
(5) මර්යදාවට අනුව විනීතව ඇඳුම් පැළඳුම් ඇඳ සිටීම

29. පතල්වල වැඩට පූජකවරුන්, රදගුරුවරුන් හා ශුද්ධෝත්තම පියතුමන්, වහලුන් ලෙස පිටුවහල් කළ අධිරාජ්‍යය සමය කුමක් ද?
(1) ඩෙසියස් (2) ට්‍රාජන්
(3) මැක්සිමිනස් (4) මාකස් අවුරේලියස්
(5) සෙප්ටිමස් සේවරස්

30. අපෝස්තලික පියවරුන් පමණක් සඳහන් වන වරණය තෝරන්න.
(1) නසියන්ස්හි ග්‍රෙගරිතුමා, හර්මස්තුමා, අතනාසියුස්තුමා
(2) අම්බ්‍රෝස්තුමා, රෝමයේ ක්ලෙමන්ට්තුමා, පපියාස්තුමා
(3) ඉග්නේෂියස්තුමා, නසියන්ස්හි ග්‍රෙගරිතුමා, හර්මස්තුමා
(4) පොලිකාප්තුමා, අගොස්තීනුතුමා, පපියාස්තුමා
(5) රෝමයේ ක්ලෙමන්ට්තුමා, පොලිකාප්තුමා, හර්මස්තුමා

31. දෙවන ශතවර්ෂය තුළ වඩාත් ම ප්‍රසිද්ධ සභා පියා ලෙස සැලකෙන්නේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ අතනාසියුස්තුමා (2) ශුද්ධ වූ සිරිල්තුමා
(3) ශුද්ධ වූ ජෙරොම්තුමා (4) ශුද්ධ වූ ජස්ටින්තුමා
(5) ශුද්ධ වූ අගොස්තීනුතුමා

32. ශාන්තුවරයින්ගේ චරිත කතා ලිවීමට පූර්වාදර්ශයක් වූ ශුද්ධ වූ ජෙරොම්තුමා විසින් රචිත ප්‍රසිද්ධ කෘතිය කුමක් ද?
(1) ඇපොලොජියා
(2) විශිෂ්ට පුද්ගලයින්ගේ ජීවිත චරිත
(3) ට්‍රයිෆෝ සමඟ සංවාදය
(4) දේව නගරය
(5) පාපොච්චාරණය

33. ටර්ටුලියන්තුමා දර්ශනවාදය, දේව ධර්මය හා තර්කවේදය යන විෂයන් මුල්කර ගෙන ලිපි ලේඛණ සකස් කළේ,
(1) ශුද්ධ වූ සභාවේ සුබෝපභෝගී ජීවිතය විවේචනය කිරීමට ය.
(2) කිතු දහම පහදා දීමට ය.
(3) ධාර්මික ඉගැන්වීම්වල අක්‍රමිකතා පෙන්වීමට ය.
(4) සභාවේ ආත්මික නිදහස රැක දීමට ය.
(5) වත්පිළිවෙත් ආරක්ෂා කිරීමට ය.

34. 'වේද භේදයක්' යනුවෙන් අර්ථ කථනය වන්නේ,
(1) ලෝක දහමේ ඉගැන්වීම්වලට පටහැනි ඉගැන්වීම් ය.
(2) ස්වාභාව ධර්මයේ තත්ත්වයන්ට විරුද්ධ මනුෂ්‍ය චර්යාවන් ය.
(3) ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම්වලට අනුකූල නොවන ඉගැන්වීම් ය.
(4) සමාජයේ පිළිගත් ආචාර ධර්මවලට පටහැනි ඉගැන්වීම් ය.
(5) පැරණි ගිවිසුමට පමණක් පටහැනි ඉගැන්වීම් ය.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

35. එපීස, නිසියාන, කැල්සිඩෝන් සහ කොන්ස්තන්තිනෝපල් යන මන්ත්‍රණ සභා පැවැත්වූ වර්ෂ පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

A - ක්‍රි. ව. 325
B - ක්‍රි. ව. 381
C - ක්‍රි. ව. 431
D - ක්‍රි. ව. 451

(1) *A, B, C, D* (2) *A, C, B, D* (3) *B, C, D, A*
(4) *B, A, D, C* (5) *C, A, D, B*

36. කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාවේ දී වේද භේදික අදහස් බැහැර කොට සභාවේ වේද අවශ්‍යතා තහවුරු කිරීම සඳහා දායක වූ සහ පියවරුන් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) බැසිල්තුමා, නසියන්ස්හි ග්‍රෙගරිතුමා සහ නිස්සාවේ ග්‍රෙගරිතුමා
(2) බැසිල්තුමා, සිරිල්තුමා සහ අතනාසියුස්තුමා
(3) නසියන්ස්හි ග්‍රෙගරිතුමා, සිරිල්තුමා සහ ජ්ලේවියන්තුමා
(4) නිස්සාවේ ග්‍රෙගරිතුමා, ජ්ලේවියන්තුමා සහ බැසිල්තුමා
(5) බැසිල්තුමා, සිරිල්තුමා සහ නිස්සාවේ ග්‍රෙගරිතුමා

37. මිනිසාගේ නියම මාතෘ භූමිය කිසියම් හතුරෙකුට ආක්‍රමණය කළ නොහැකි බව සඳහන් වන ශුද්ධ වූ අගොස්තීනුතුමාගේ කෘතිය කුමක් ද?
(1) දේව නගරය (2) පූර්ණ දිවියකට මග (3) ඇතුලාන්ත මන්දිරය
(4) ආත්මයේ අඳුරු රාත්‍රිය (5) ප්‍රේමයේ ජීවන දැල්ල

38. ස්ලැවික් ගෝත්‍රික ජනතාවට සිරිල්තුමා හඳුන්වා දුන් නව අක්ෂර මාලාව හා භාෂාව දායක වූයේ කුමක් ගොඩනැගීම සඳහා ද?
(1) සම්ප්‍රදාය (2) සංස්කෘතිය (3) වත්පිළිවෙත (4) දහම (5) වංශය

39. අති උතුම් දෙවන උර්බාන් පාප්වහන්සේගේ නායකත්වය යටතේ පළමු කුරුස යුද්ධය ඇතිවීමට හේතු වූයේ කුමක් ද?
(1) නව ප්‍රතිසංස්කරණ ඇති කිරීමට ය.
(2) වතිකානයේ පාලන බලය ආරක්ෂා කිරීමට ය.
(3) ශුද්ධ වූ දේශය නැවත අත්පත්කර ගැනීමට ය.
(4) ආසන දෙව්මැදුර ආශ්‍රිත ගොඩනැගිලි ආරක්ෂා කිරීමට ය.
(5) ලෞකික සැප සම්පත් රැස්කර ගැනීමට ය.

40. මාටින් ලූතර්තුමාගේ ප්‍රධාන ඉගැන්වීමක් වන්නේ,
(1) ජීවිතය අවසානයේ ගැලවීම දයාවේ ක්‍රියාවන්ගෙන් පමණක් ලැබෙන බවයි.
(2) නීත්‍යානුකූල නොවන සියලු දේ බැහැර කළ යුතු බවයි.
(3) ජනතාවගේ ආත්මික වර්ධනය උදෙසා ක්‍රියාකාරී වීම අවශ්‍ය බවයි.
(4) කිතු සසුන සියලු ඇදහිලිවන්තයින්ගේ සහභාගිත්වයෙන් සිදු විය යුතු බවයි.
(5) සභාව තුළ සිටිමින් ප්‍රතිසංස්කරණවාදී සන්ධානයක් බිහි කළ යුතු බවයි.

41. පෙරදිගට පැමිණි පෘතුගීසීන් 'පද්‍රෝ ආඩෝ' සැලසුම මගින් උනන්දු කරනු ලැබුවේ,
(1) සමාජ සුබසාධනය සඳහා ය.
(2) සෞඛ්‍ය පහසුකම් ගොඩනැගීම සඳහා ය.
(3) පාසල් ඉදිකිරීම සඳහා ය.
(4) රට රාජ්‍යයන් යටත් කර ගැනීම සඳහා ය.
(5) ධර්ම ප්‍රචාරය සඳහා ය.

42. පරරාජසේකරන් රජුගේ පුත්‍රයා මෙරට බෞතිස්මය ලබා පසුව ගෝව නගරයට ගොස් පූජකවරය ලැබුවේ,
(1) ෆ්‍රැන්සිස්කාන නිකායෙනි. (2) අගොස්තීනු නිකායෙනි. (3) ජේසු නිකායෙනි.
(4) දොමිනිකාන නිකායෙනි. (5) නිර්මල මරිය නිකායෙනි.

43. බටහිර වෛද්‍ය ක්‍රමය ආරම්භ වීම හා රෝහල් පිහිටුවීම ආරම්භ කළේ,
(1) පෘතුගීසින් පැමිණීමට පෙර යුගයේ දී ය.
(2) පෘතුගීසි යුගයේ දී ය.
(3) ලන්දේසි යුගයේ දී ය.
(4) බ්‍රිතාන්‍ය යුගයේ දී ය.
(5) නිදහස් යුගයේ දී ය.

[සැගවුනි පිටුව බලන්න.
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

44. ලන්දේසි පාලන සමයේ හිතකර ලක්ෂණයක් වූයේ,
(1) මැග්නා කාටර් පනත ක්‍රියාත්මක කිරීමයි.
(2) අපරදිග භාෂා හා අධ්‍යාපන ක්‍රමය මෙරට තුළ ව්‍යාප්ත කිරීමයි.
(3) විවාහයේ ස්ථාවරත්වය තහවුරු කිරීමයි.
(4) අධ්‍යාපන කටයුතු මනා ලෙස සංවිධානය කිරීමයි.
(5) උපත් හා මරණ ලියාපදිංචිය ආරම්භ කිරීමයි.

45. අන්නාවි, සන්ක්‍රිස්තියන් හා මුහුප්පු වැනි මුල් ගිහි නායකයින් පත්කර ඔවුන්ගේ සේවාව සංඝවලට ලබා ගැනීමට ඉඩ සලස්වන ලද්දේ කවුරුන් ද?
(1) ගරු ගොන්සාල්වේස් පියතුමා
(2) ගරු සීමන් ද කොයිම්බ්‍රා පියතුමා
(3) ගරු ජෝන් ද විලා කොන්දේ පියතුමා
(4) ගරු ක්ලෙමන්ට් මිරැන්ඩා පියතුමා
(5) ගරු ජුසේ වාස් පියතුමා

46. එංගලන්ත සභාව නියෝජනය කරමින් ක්‍රි. ව. 1805 දී මෙරටට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම කුමක් ද?
(1) ලන්ඩන් ධර්මදූත කණ්ඩායම
(2) බැප්ටිස් ධර්මදූත කණ්ඩායම
(3) වෙස්ලියන් ධර්මදූත කණ්ඩායම
(4) ඇමරිකන් ධර්මදූත කණ්ඩායම
(5) ගැලවීමේ හමුදාවේ ධර්මදූත කණ්ඩායම

47. සෑම ආගමකට ම පාසල් ආරම්භ කර පවත්වා ගෙන යාමට අවසර තිබිය යුතු බව යෝජනා කළේ කවුරුන් ද?
(1) ගරු ජෝශප් සැමේරියා පියතුමා (2) ගරු දොන් පීටර් පියතුමා
(3) ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා (4) ගරු පීටර් පිල්ලේ පියතුමා
(5) ගරු ජෝශප් මේරි බ්‍රාව් පියතුමා

48. මනුෂ්‍යයාගේ උතුම්කම රඳා පවතින්නේ ඔහුට ම විශේෂිත වූ,
(1) බුද්ධිය මත ය. (2) ප්‍රඥාව මත ය. (3) සුදුසුකම් මත ය.
(4) හෘද සාක්ෂිය මත ය. (5) තනතුර මත ය.

49. වර්තමානයේ මිනිසාට මුහුණ දීමට සිදු වී ඇති බිහිසුණු ස්වභාවික ව්‍යසනවලට හේතුව වන්නේ,
(1) පරිසරය විනාශ කිරීමයි.
(2) අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමයි.
(3) සංවර්ධන ප්‍රතිපත්ති උල්ලංඝණය කිරීමයි.
(4) දරිද්‍රතා මට්ටම ඉහළ යාමයි.
(5) තාක්ෂණික මෙවලම් භාවිතයයි.

50. කැන්ටබරියේ අගරදගුරු අති උතුම් මයිකල් රම්සි හා අති උතුම් සයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් ආරම්භ කරන ලද කොමිසම කුමක් ද?
(1) අන්තර් නිකායික සහයෝගිතා කොමිසම
(2) කිතුනු සභා ඒකත්වය නගාලීමේ කොමිසම
(3) ස්කොලාකල් කොමිසම
(4) විශ්වාස ප්‍රවර්ධන කොමිසම
(5) එංගලන්ත රෝමානු කතෝලික අන්තර් ජාතික කොමිසම

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

AL/2026/43/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ක්‍රිස්තියානි ධර්මය	II
கிறிஸ்தவம்	II
Christianity	II

43 S II

පැය තුනයි	
மூன்று மணித்தியாலம்	
Three hours	

අමතර කියවීම් කාලය	-	මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	-	10 நிமிடங்கள்
Additional Reading Time	-	10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) ලුහුබැඳ එන පාරාවෝ රජුගේ හමුදාව ඉදිරියේ අසරණ වූ ඉශ්‍රායෙල් ජනයා අවලාද කීවේ කවුරුන් හට ද? (ලකුණු 02යි)

   (ii) දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනයා සමග වැඩ සිටීමේ හා මග පෙන්වීමේ සලකුණු **දෙක** සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (iii) කාන්තාර ගමනේ දී ඉශ්‍රායෙල් ජනතාව කෙදිරි ගෑමේ ප්‍රධාන අවස්ථා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) දෙවියන් වහන්සේ පුරාණ ගිවිසුමේ තෝරාගත් ජනතාවට අනාවරණය වීම තුළ ඔබට ලැබෙන අත්දැකීමෙන් සමාජයට කළ හැකි සේවා **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

2. (i) හෙබ්‍රෙව් බසින් දිවැසිවරයා 'නබී' ලෙස හඳුන්වනු ලැබේ. එම වචනයේ අර්ථ **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

   (ii) පැරණි දිවැසිවරුන්ගේ දූත මෙහෙවරෙහි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (iii) නාතාන් දිවැසිවරයා විසින් දාවිත් රජුට ප්‍රකාශ කළ මෙසියස්තුමා සම්බන්ධ වැදගත් කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ ඔබ ලද දිවැසිවර කාර්යය අද සමාජය තුළ ජීවත් කරවන ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

3. (i) ශ්‍රී ලංකා සභා ඉතිහාසය හැදෑරිය යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

   (ii) ක්‍රි. ව. 1505ට පෙර (පෘතුගීසින් පැමිණීමට පෙර) ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (iii) සිය රාජ්‍යය ආරක්ෂා කර ගැනීමට හත් වන බුවනෙකබාහු රජු විසින් තම රාජ දූතයා පෘතුගාලයේ ලිස්බන් නුවරට යවා ඉදිරිපත් කළ ඉල්ලීම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන්ගෙන් සිදු වූ සේවා **හතරක්** සඳහන් කර ඒ අනුව, වර්තමානයේ ධර්මදූත සේවයේ නියැලෙන්නන් ක්‍රියා කළ යුතු ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

II කොටස

4. (i) ජොෂියා රජතුමා පිළිබඳ වැදගත් කරුණු **පහක්** සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) එක්සත් දේශයක් ගොඩනැගීමෙහි ලා තරුණ දරුවකු ලෙස ජාතික ආගමික සංහිඳියාව සඳහා ගත හැකි පියවර **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

5. (i) ජොහන් සුබාරංචියේ මුඛ්‍ය පරමාර්ථය ලියා එයට අදාළ මූලාශ්‍ර **ගතරක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) සුබාරංචි කතුවරුන් 'ක්‍රිස්තුන් වහන්සේ නැමැති සුබාරංචිය' ප්‍රචලිත කිරීමට ගත් උත්සාහය ඇදහිල්ල හීන වූ සමාජයක් තුළ ඔබ ක්‍රියාවට නන්වන ආකාරය කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

6. (i) මහා මංගල දේශනාවේ පරමාර්ථ **පහ** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) මිනිස් සිත් තුළ ඇති අධම ගති මෙන් ම නපුරු අන්ධකාරයන් රජයන සමාජයක ඔබ පොළොවේ ලවණ මෙන් ම ලෝකයේ ආලෝකය මෙන් ද ක්‍රියා කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)

7. (i) ක්‍රි. ව. 313 දී නිකුත් වූ ආඥාව සමග ලැබුණු වරප්‍රසාද **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) වත්මන් කිතුනුවන් ලෙස ජීවිත අභියෝගවලට මුහුණ දීමේ දී දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය සවිමත් කර ගැනීමට ගත හැකි ක්‍රියාවන් **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

8. (i) මානව සංවර්ධනය සඳහා කිතුනු සහභාගිත්වය පිළිබඳ ශුද්ධ බයිබලය හා සභා ඉගැන්වීම් අනුසාරයෙන් කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) යුදගිනි ඇවිලෙන නූතන ලොව තුළ ලෝක සාමය උදාකිරීමෙහි ලා කිතුනුවකු ලෙස ඔබ ඉදිරිපත් කරන යෝජනා **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/